# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1986 අංක 19 දරන වෙඩිපිටි සහ යුද්ධ හමුද පුහුණුවීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ජූලි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 30 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1986 අංක 19 දරන වෙඩි පිටි සහ යුද්ධ හමුදා පුහුණුවීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 ජූලි මස 24 වන දින.]

එල්.ඩී.—ඕ. 25/85.

**වෙඩි පිටි සහ යුද්ධ හමුදා පුහුණුවීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 19 දරන වෙඩි පිටි සහ යුද්ධ හමුදා පුහුණුවීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:— ලුහුඬු නාමය.

2. වෙඩි පිටි සහ යුද්ධ හමුදා පුහුණුවීම් පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— 363 වන අධිකාරයේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වෙඩි පිටි පාවිච්චි කිරීම.

3. (1) අමාත්‍යවරයා විසින් පොදු හෝ විශේෂ නියමයක් මගින් නිශ්චය කළ හැකි ශ්‍රී ලංකාවේ යම් නාවික, යුද්ධ, ගුවන් හමුදාවක් හෝ පොලිස් හමුදාවක් විසින් කවර වූ හෝ වෙඩි පිටියක් යම් වෙඩි තැබීමේ අභ්‍යාසයක් සඳහා පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(2) (අ) අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් වෙඩි තැබීමේ අභ්‍යාසයක් සඳහා, යම් කාලයක් තුළ සහ යම් කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාව නොවන කවර වූ හෝ රටක කවර වූ හෝ නාවික, යුද්ධ හෝ ගුවන් හමුදාවක් විසින්, අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, කවර වූ හෝ වෙඩි පිටියක් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(ආ) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වෙඩි තැබීමේ අභ්‍යාසයක් සඳහා, යම් කාලයක් තුළ සහ යම් කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවේ රයිපල් සංගමයේ කවර වූ හෝ සාමාජිකයකු විසින්, එම ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, කවර වූ හෝ වෙඩි පිටියක් පාවිච්චි කළ හැකි ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.